රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව,

කෑගල්ල දිස්ත්‍රික්කය

...............................................

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 ජූලි 16 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 25 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 06 සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්.

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2007 වර්ෂයට අදාලව කඩ කාමර කුලී රු.11,000 ක් කපා හැරීම සමාලෝචිත වර්ෂයේ වැය ශීර්ෂයන්ට හර කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු. 11,000 ක් අඩුවෙන් පෙන්වා තිබුණි.

(ආ) ඉදිරි වර්ෂය වෙනුවෙන් ලද රු.67,095 ක් වූ වරිපනම් බදු ආදායම ලැබිය යුතු වරිපනම් බදු ආදායමට හිලව් කිරීම නිසා 2014 දෙසැම්බර් 31 දිනට කලින් ලද ආදායම් හා හිඟහිටි ආදායම් රු.67,095ක් බැගින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට සබරගමු පළාත් සභාවෙන් හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් පරිත්‍යාග වශයෙන් ලද වටිනාකම රු. 13,653,200 ක් වූ වාහන 09ක් ප්‍රාග්ධනිත නොකිරීම නිසා

2014 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම්වල හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමේ ශේෂය රු. 13,653,200 ක් බැගින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වලින් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ඉඩම් හා ගොඩනැගිලි ලෙස රු. 27,005,095 ක් ගිණුම් වලින් දක්වා තිබුණ ද ඒ සඳහා උපලේඛන ගිණුම සමඟ ඉදිරිපත් කර නොතිබුණි.ස්ථාවර වත්කම් ලේඛන අනුව අක්කර 08 පර්චස් 10 ක් වූ ඉඩම් කට්ටි 13 ක නිවැරදි වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කර නොතිබූ අතර , තවත් ඉඩම් කට්ටි 50 ක කිසිදු වටිනාකමක් ගිණුම් මගින් දක්වා නොතිබුණි.

(ඉ) දුරකථන සම්ප්‍රේෂණ කුළුණු සඳහා සන්නිවේදන සමාගම් තුනකින් 2008 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා අවස්ථා 05 කදී අයකරන ලද රු. 507,600 ක් හා ඉඩම් කට්ටි කිරීම වෙනුවෙන් අවස්ථා දෙකකදී අයකරන ලද රු. 350,000ක් මුදලක් තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබීම නිසා 2014 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදල් ගිණුම රු. 857,600 ක් අඩුවෙන් හා පොදු තැන්පත් වල වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන තුළින් දක්වා තිබුණි.

(ඊ) 2006 වර්ෂයේ සිට සේවකයන් 06 දෙනෙකුගෙන් අයකර ගන්නා ලද රු. 18,500 ක සේවක ඇප තැන්පත් මුදල්, පොදු තැන්පත් ලෙස ගිණුම්ගත කිරීම නිසා 2014 දෙසැම්බර් 31 දිනට රු.18,500 ක් පොදු තැන්පත් වැඩියෙන්ද සේවක ඇප තැන්පත් හා සේවක ඇප තැන්පත් ආයෝජන වල වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශන තුළින් දක්වා තිබුණි.

1.3.2 නොසැසඳුන පාලන ගිණුම්

------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 06 කට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු.29,290,928 ක් වූ අතර, ඊට අදාල උපයෝගී ලේඛන/වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.47,345,354 ක් වූයෙන් වෙනස රු.18,054,426 ක් විය.

1.3.3 අවිනිශ්චිත ගිණුම

-----------------------

2014 දෙසැම්බර් 31 දිනට රු.18,981 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

------------------------------------

(අ) 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.27,810,709 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.5,834,315 ක් විය.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට ගෙවියයුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.9,955,234 ක් වූ අතර , අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.4,628,076 ක් විය.

1.3.5 නීති රීති, රෙගුලාසි වලට අනුකූල නොවීම.

------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම. |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| (i) මු.රෙ.371 (2)(ඇ) | - | තත්කාර්ය අතුරු අග්‍රිම වශයෙන් ලබා ගන්නා ලද මුදල් අදාල කාර්යය නිමකළ වහාම පියවිය යුතු වුවත් රු.625,653 ක අත්තිකාරම් මුදල් පියවා නොතිබුණි. |
| (ii) මු.රෙ.571 | | වර්ෂ දෙකක් තුළ හිමිකම් නොපෑ රු.195,289 ක තැන්පතු නියාදනය කර නොතිබුණි. |

(ආ) ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ

| | | | |
|---|---|---|---|
| (i) | xxiv ඡේදයේ 1.6 හා 4 වගන්තිය | - | නිලධාරින් 08 දෙනෙකුගෙන් 2002 වර්ෂයේ සිට අයකරගත යුතු රු.441,744ක සේවක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) | 11 වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 27 වගන්තිය | - | බදු මුදල් ලෙස ලැබුණුරු.485,399 ක් සභාවට භාර නොදී පෞද්ගලිකව පරිහරණය කර තිබූ ආදායම් පරිපාලක නිලධාරියෙකු අල්ලස් චෝදනා ලබා වැඩ තහනමට ලක්ව වසර 10 ක් ගතවී තිබුණ ද ඒ සම්බන්ධව විධිමත් විනය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල.

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,567,191 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,247,946 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.3,815,137 ක වර්ධනයක් දක්නට ලැබුණි.

2.2 ආදායම් පරිපාලනය

-----------------------

2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

----------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2014.01.01දිනට හිගය | 2014.12.31 දිනට හිගයෙන් අයකිරීම | 2014 වර්ෂයේ බිල් කිරීම් | වර්ෂයේබිල් කිරීම්වලින් අයවීම | 2014.12.31 දිනට හිගය<br>2014.01.01 දිනට පැවති හිගයෙන් | වර්ෂයේ බිල් කිරීම් වලින් හිඟය | මුළු හිගය |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| iවරිපනම් හා බදු | 2,137,269 | 423,282 | 3,029,086 | 1,991,542 | 1,713,987 | 1,037,544 | 2,751,531 |
| ii බදු කුලී | 2,045,891 | 768,224 | 6,291,138 | 5,549,830 | 1,277,667 | 741,308 | 2,018,975 |
| iii බලපත්‍ර ගාස්තු | 80,398 | - | 163,500 | 163,500 | 80,398 | - | 80,398 |
| ivවෙනත් ආදායම් | 14,730,112 | 11,967,849 | 42,165,513 | 21,967,971 | 2,762,263 | 20,197,542 | 22,959,805 |

2.2.2 බලපත්‍ර ගාස්තු

------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත හා එයට අනුව සිදු කරන ලද සංශෝධන ප්‍රකාරව කර්මාන්ත කරගෙන යාම සඳහා පරිසර බලපත්‍ර ලබාගත යුතු වුවද, කර්මාන්ත 21 ක් සඳහා පරිසර බලපත්‍ර ලබා නොගැනීම මත සභාවට රු. 88,000 ක ආදායමක් අහිමි වි තිබුණි.

(ආ) සභා බල ප්‍රදේශය තුළ ස්ථානගත කර ඇති සම්ප්‍රේෂණ කුළුණු මත වාර්ෂික බලපත්‍ර ගාස්තු අයනොකිරීම හේතුවෙන් සභාවට රු. 36,000 ක ආදායමක් අහිමි වී තිබුණි.

(ඇ) 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අඛණ්ඩව පරිසර බලපත්‍ර ලබාගෙන තිබුණු ලී මෝල් සහ වඩුමඩු 19 ක් සඳහා වෙළඳ බලපත්‍ර / ව්‍යාපාර බදු අයකර ගැනීමට කටයුතු නොකිරීමෙන් 2014 වර්ෂයේදී පමණක් ප්‍රාදේශීය සභා අරමුදලට රු. 19,000 ක ආදායමක් අහිමි වි තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------------

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

(අ) සභාබල ප්‍රදේශය තුළ අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් අවස්ථා 04 කදී ලැබුණු පැමිණිලි සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය දරන සේවකයින් 06 ක් සඳහා සේවක භාර අරමුදලට දායක මුදල් නොගෙවිය යුතු වුවද, 2014 වර්ෂයේදී පමණක් රු.34,509 ක දායක මුදලක් ගෙවා තිබුණි.

3.2 අවිධිමත් ගනුදෙනු

-----------------------

(අ) සභාපතිවරයා විසින් 2013 සැප්තැම්බර් 19 සිට 2013 ඔක්තෝබර් 22 දක්වා කුලී ගෙවීමේ පදනම මත භාවිතා කළ වාහනය සඳහා රු.93,500 ක් ගෙවා තිබුණි. ප්‍රධාන අමාත්‍යවරයා විසින් රු.73,334 ක වියදමක් අනුමත කර තිබුනෙන් අනුමැතිය නොලත් වියදම රු.20,161 ක් විය.

(ආ) මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් නඩත්තු කරනු ලබන වරාවල නව පාලමේ 2013 වර්ෂයේ විදුලි බිල්පත් රු. 48,227 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

ගිවිසුම් ගත මුදල රු. 842,707 ක් වූ සභා කර්මාන්ත 06 ක් සඳහා 2014 දෙසැම්බර් මස ගිවිසුම් අත්සන් කර ඇතත් 2015 ජූලි 10 විගණන දින වන විටත් වැඩ ආරම්භ කර නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---------------------------------------

4.1 පිළිතුරු නොලත් විගණන විමසුම්

-------------------------------------

2015 ජූලි 23 දින වන විට විගණන විමසුම් 07 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එකී විමසුම් වලට භාජනය වූ ගණනය කළහැකි ගනුදෙනු වල වටිනාකම රු. 3,548,989 ක් විය.

5. පද්ධති හා පාලන

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය